මුතු කරාබුව

තරංග ජයසේන

ඇගේ හඬන ඇස්

මේ කතාබහ දරුවෙකුගෙන් පටන් ගන්නට හිතුණා.

.....මම කිලිනොච්චි නගරයට කි.මී. පහක් පමණ දුරින් පිහිටි ළමා පුනරුත්ථාපන ආයතනයකට ගියෙමි. යුද්ධයෙන් දෙමාපියන් අහිමි වූ දරුවන් තුන්සියයකට අධික පිරිසක් එහි සිටියේ ය. අවුරුදු තුනක් පමණ වයසැති දැරියක් වඩා ගත් මට දැණුනේ ඇය මගේ ළයට දැඩිව හේත්තු වූ බව ය. බිමින් තබන්නට උත්සාහ දැරූ හේතුවෙන් එම දැරිය මගේ ළය දැඩිව බදා ගත්තාය.

"එයාගෙ තාත්තා ආවා කියලා රැවටිලා."……1

සුදු පාට පසුබිමක මුද්‍රණය කළ මේ කළු පාට අකුරු සෙමෙන් බොඳ වී යන සේ දෑස් අඩවන් කොට බලන්න. ඔබට ඒ අවකාශය ඇතුළේ ඇගේ දෑස් පෙනෙනවාද? මිලින වූ සුදු ඉංගිරියාව මැදට වී හුදකලාව- ආදරය අයදින ඇගේ කළු ඉංගිරියාව! සෙමෙන් තෙත්වන ඇස් කෙවෙණි! අකුරු අතරින් ගලවාගෙන ඈ ගෙන ඔබේ ළයට තුරුළු කරගන්න. ඇගේ සිගිති ළය දැන් ගැහෙන්නේ ඔබේ ළඟින්ම නේද?

අපි මේ අහිංසක බිළිඳුන්- ඔවුන් සිර කරනු ලැබ ඇති මේ අකුරු සහ වචන සිර ගෙවල්වලින් මුදවා ගන්නේ කවදාද? උන්ට හැංගී හඬන්නට තරම් විසල් පපු-තුරක් ඇත්තේ කොහිද?

දිනෙක, උත්තරය ඒකීය රාජ්‍යය හෝ ෆෙඩරල් හෝ ඊළම හෝ වෙන කිසිවක් හෝ වෙනු ඇත. එහෙත් උණුහුමට තුරුළු වෙන්නට පපු-තුරක් සොයනා මේ අහිංසකයන් ඒ වෙනුවෙන් ගෙවනා වන්දිය කුමක්ද? යුදෙන් දරුවන් මියැදුණු අම්මලා- තාත්තලාගේ පපුවල ඇවිළෙන ගින්න නිවෙන්නේ ඉහත කී කවර නම් උත්තරයකින්ද?

අපේ දරුවන් මරා දමමින්- සරණාගතයන් බවට පත් කරමින්- ඔවුන්ගේ ළදරු සිහින පුපුරුවා හරිමින් මේ කෙළින පිස්සුවේ ඉම කුමක්ද? සමාවෙන්න. ජීවිතයට වඩා මරණය මාර වූයේ කොහොමද?

ඒ "මාර" මරණයට- මන්නාරම- යාපනය- බ්‍රත්තල- නුගේගොඩ- කොටුව කියා වෙනසක් නැත. ඒ "මාර" මරණයට දෙමළ- සිංහල- කොටි- ආමි කියා වෙනසක් නැත. ඒ "මාර" මරණයට දරුවන් කියා වෙනසක් නැත. අපි මහ පොළවෙ අයිතිය වෙනුවෙන් මහ පොළොව බදා ගෙන පාරවල් දිගේත් යුද බිමේත් මිය යමින් හිඳින්නෙමු. අපිම වැපිරූ දෙයෙහි අස්වැන්න අපිම නෙලා ගනිමින් හිඳින්නෙමු.

සිවරමණී
මම සිවරමණීට ඇගේ නම සිංහලෙන් ලියන්නට ඉගැන්වීමි.
සි ව ර ම ණී
ඇගේ සිහින් අතැඟිලි රිදෙන තරමට මගේ දකුණතින් මිරිකාගෙන 'ම'යන්න ලියන හැටි උගන්වන විට 'ඔව් ඔව්, ඔව්, ඔයාගෙ බාසාව මට තේරෙනවා'යි කියන්නාක් මෙනි සිවරමණී මා දෙස නෙත් කොනින් බැලූවේ.
ම - ම, ඉරෙණ්ඩු ම - මම
මම සිවරමණී?
නාන් සිවරමණී.
මම සිවරමණීට?
නාන් සිවරමණීයෙ
"ම්... ම්... නාන් සිවරමණීයෙ
කාදලික්කිරේන්"
මගේ දෑසට එල්ල වූ ඇගේ බැල්ම පාෂාණීභූත විය.
"ප්ත්"
"?....?....?"
"පොයි සොල්ල වේණ්ඩාම්"
"මම බොරු කියන්නෙ නෑ"
"ඔයාල ඔක්කොම කියන්නෙ පොරු" යයි සිවරමණී පෑන මේසය මත අතහැර පුටුවේ පස්සට වී, පුටු පත්තට වාරු වී ඇගේ දෑසේ බැල්ම ඈත කොහේදෝ පාළු ලෝකයකට යොමු කරවාගෙන හිඳින්නට වූවා ය.
කිසිවිටක කටින් නො කීව ද සිවරමණී මට ආදරය කළ බව මම දනිමි. ඒ ආදරය බියෙන් සැකයෙන් ඇගේ නෙත් පතුළේ සැඟවී තිබෙන අයුරු මම දැක ඇත්තෙමි.2

කෙටි කතාවේ වියමනින් එළියට ගෙන සිවරමණීව කොටුව දුම්රිය පොළ අසල ඔල්කට් පිළිමය ළඟ තියමු. දැන් සිවරමණී යනු මොහොතකින් පුපුරා යාමේ ඉඩක් ඇති කිසිවකි. ඈ දෙසට එල්ල වූ දහක් උකුසු ඇස් ඈ සඟවා ගෙන සිටින බෝම්බය සොයනු ඇත. ලේඛකයා කතාවෙහි කියන්නේ සිවරමණීගේ පතුල් වලට දාදිය දැමූ බවයි. බෝම්බයක් තිබීම හෝ නොතිබීම කෙසේ නමුදු, සිවරමණීගේ පතුල් වලට දාඩිය දමයි. අවට සිටින්නෝ බියෙන් ඇලලෙත්. බියෙන් දාදිය දැමූ සිවරමණීලාගේ පතුල් නොදුටු මුළු මහත් සමාජයේම පතුල් වලට දාදිය දමමින් තිබෙයි.
සැබෑ පුපුරායාම් සිදු වන්නේ මේ පිපිරීම් අතර වූ සැකයෙන් ද බියෙන් ද හිරි වැටී ගිය ඉඩෙහිය. ඒ පිපිරීම් වලට හසුව- සිංහල දෙමළ ලෙස ලේබල් කරන ලද එකම මිනිස් වර්ගයක් සිය ආත්මයන් ඇතුළේම නැවත ද නැවත ද මිය යති. මරණය සම්භාවිතාවය මුල් කොට ගත් ගණිතමය ක්‍රීඩාවක් පමණට සැහැල්ලු වී තිබේ. උදේ ගෙදරින් ගිය මිනිහෙකු නිරුපද්‍රිතව ගෙදරට සේන්දුවීම සැමරිය යුතු තරමේ සුවිශේෂීතාවයක් වී තිබේ.

ශාන්තිනී
ආදරයට සීමා නැත. දෙහදක පැන නැගෙන ආදරය කිසිදු බසක් නොදොඩයි. එහි බස ආදරයටම ආවේණික වූ කිසිවකි. එහෙත් ආදරය පිළිනොගන්නා බැහැර ලෝකය භාෂා ගණනාවක් දොඩයි. එනිසා ආදරයට නිදහස් පැවැත්මක් නොමැත. එය මහ මග පුපුරා යයි.
ආදරයට ජාතියක් නොමැත. එය මිනිස් ජාතියට අයත් වූවකි. එහෙත් ආදරය පිළිනොගන්නා බැහැර ලෝකය ජාතීන්ට බෙදී යුද වදිමින් සිටී. එනිසා ආදරයට වෙඩි වදී.
ඉදින් මහත්වරුනි, සියල් සිරිත් දෑ කුල ගොත් ආපසු ගෙන ආදරණීය ශාන්තිනීව පමණක් ඉල්ලන මේ මනුස්සයා දෙස මඳක් බලන්න.

ශාන්තිනී තෙමා වැටී නළල කුංකුමම් කුංකුමම් තෙමා අහසේ අඩන චන්දිරන් පහන් වැටම ගිනි ඇවිලී අන්න නැගෙන දුම් ශාන්තිනී අපි දෙවියන් ඇති තැනකට යන්

කඳුළු උඩට තිරුවංගල් එළිය වැටීමෙන් නුඹේ මුහුණ කියා ගන්න බැරි කවියකි දැන් බියේ සැලෙන ඔය දෑතේ වළලු ඔය තරම් බරද කියාපන් කෙල්ලේ බරද කියාපන්

සියල් සිරිත් දෑ කුල ගොත් ඔබ ආපසු ගන්න
මහත්වරුනි ශාන්තිනී විතරක් මට දෙන්න
තිරුක්කුරල් පොත අරින්න දෑස පියා ගන්න
මහත්වරුනි මා නෙළු මල මට සිඹින්න දෙන්න3

උණුහුමට පපු-තුරක් සොයන දරුවන්ට ද- පතුල් වලට දහදිය දමන සිවරමණීලාට ද- බියෙන් සැලෙන ශාන්තිනීලාට ද- ඔබට ද- අපට ද එකට ගුලි වී සහෝදරත්වයෙන් ජීවිතය විඳ ගන්නට හැකි අවකාශයක් තනමු.

1-තිඹිරියාගම බණ්ඩාරගේ "සම්භාෂා" කොලමෙන් (අවතැන් ජීවිත - රාවය 2008.02.03) උපුටාගන්නා ලද කොටසකි.

2-ජයතිලක කම්මැල්ලවීර ලියූ "පොයි සොල්ල වේණ්ඩාම්" වියමනෙන් උපුටා ගන්නා ලද කොටසකි. (5 වැනි ජවනිකාව කෙටි කතා සංග්‍රහය)

3-රත්න ශ්‍රී ලියා, කපුගේ සංගීතවත් කොට, දිවුල්ගනේ ගැයූ ප්‍රකට ගීතය.

තරංග ජයසේන
koombiyaonline@gmail.com

DD
REFRIGERATION

Contact
Dhammika Kulatunga
Ph: (03) 93085309
Mob: 0411272162

Split type air conditioning installation, repairs & maintenance.

Repairs of refrigerators, deep freezers and cool rooms.

Repairs of electrical appliance.

Fully licensed for air-conditioning plumbing

ශ්‍රී ලාංකික ඔබේ රියදුරු පාසල

Ravin රවින්
Professional / Patient Instructor
Easy Learning Techniques
Exceptional Pass Rate

Iyoka Driving School
Training Excellence

Tel : 94021196
Mobile : 0433028029
iyoka_ds@yahoo.com.au